**බලංගොඩ නගර සභාව - 2023**

**-------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

බලංගොඩ නගර සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන නගර සභා ආඥා පනතේ (255 අධිකාරය) 181 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට බලංගොඩ නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

නගර සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය

ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, නගර සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

### 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පුනරාවර්තන ස්වරූපයේ යන්ත්‍රෝපකරණ නඩත්තු වියදම් රු.113,250ක් ප්‍රාග්ධනීත කර තිබුණි. | 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි කරනු ලැබේ. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (ආ) | ඉඩම් හා ගොඩනැගිලි රු.641,893ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි.. | - එම - | - එම - |
| (ඇ) | ආරම්භක හා අවසාන ආයුර්වේද බෙහෙත් තොගය පිළිවෙලින් රු.322,556ක් හා රු.303,616ක් ගිණුම්ගත කර නොතිබුණු අතර, වර්ෂය තුළ ගැනුම් රු.599,725ක් වියදමට හරකර තිබුණි. | 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි කරනු ලැබේ. | නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු වේ. |
| (ඈ) | ණයහිමියන්ට 2022 වර්ෂයේ ගෙවූ රු.1,392,773ක් 2023 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ලෙස දක්වා තිබුණි. . | - එම - | - එම - |
| (ඉ) | කර්මාන්ත 03ක් සඳහා ගෙවිය යුතු මුදල රු.5,186,322ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | - එම - | - එම - |
| (ඊ) | 2022 වර්ෂයේ ලද ණයගැති ලැබීම් රු.108,109ක් 2023 වර්ෂයේදී ලැබිය යුතු ලෙස නැවත ගිණුම්ගතකර තිබුණි. | - එම - | - එම - |
| (උ) | ලද ඇප මුදල් රු.250,000ක් ආදායමට හිලව් කර තිබුණද, එය ගිණුම්ගතකර නොතිබුණි. | - එම - | - එම - |
| (ඌ) | මුදලින් ගෙවූ රු.742,500ක් නිසි පරිදි ගිණුම්ගත කර, නැවතත් එම මුදල ණයහිමියන්ට බැරකර වර්ෂයේ වියදමට ගෙන තිබුණි. | - එම - | - එම - |
| (එ) | ඉදිරි වර්ෂය සඳහා රක්ෂණ ගෙවීම් රු.196,596ක් 2023 වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | - එම - | - එම - |
| (ඒ) | මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනට ගිණුම් 03ක ශේෂ සහ උපයෝගී ලේඛන අනුව එදිනට එම ශේෂ අතර රු.3,024,685ක වෙනසක් විය. | ඉදිරියේදී නිවැරදි කරනු ලැබේ. | නොසැසඳීම්, සැසඳිය යුතු වේ. |

## 1.6.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එකතුව රු.498,499,763ක් වූ ගිණුම් විෂයයන් 04ක යාවත්කාලීන කළ ස්ථාවර වත්කම් ලේඛනය සහ විස්තරාත්මක උපලේඛන ඉදිරිපත් නොකෙරුණි. | වත්කම් වෙනුවෙන් වෙන් වෙන්ව උපලේඛන තබා ගැනීමට කටයුතු කරමි. | වත්කම් ලේඛන හා උපලේඛන නිසි පරිදි නඩත්තු කළ යුතු වේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන ආදායම ඉක්මවූ වියදම රු.905,463ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.4,227,487ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 13,145,000 | 11,352,210 | 11,452,200 | 6,119,239 | 10,777,000 | 11,611,507 | 12,335,139 | 6,156,320 |
| කුලී | 37,792,000 | 41,884,327 | 41,395,622 | 488,705 | 36,096,000 | 35,675,467 | 34,481,551 | 860,427 |
| බලපත්‍ර ගාස්තු | 2,690,000 | 2,077,137 | 2,135,001 | - | 2,285,000 | 1,534,728 | 1,379,728 | - |
| වෙනත් ආදායම් | 29,501,000 | 29,180,168 | 35,278,760 | - | 27,030,000 | 24,701,612 | 24,957,583 | - |
| | 83,128,000 | 84,493,842 | 90,261,583 | 6,607,944 | 76,188,000 | 73,523,314 | 73,154,001 | 7,016,747 |

#### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඉකුත් වර්ෂ හා 2023 වර්ෂයට අදාළ හිඟ වරිපනම් හා බදු රු.6,119,240ක් අයකර නොතිබුණු අතර, එහි කාල විශ්ලේෂණයක් ද සකස් කර නොතිබුණි. | නව වරිපනම් මෘදුකාංගය සම්පූර්ණ වූ පසුව කාල විශ්ලේෂණ සිදු කරමි. | හිඟ ආදායම් රැස්කර ගැනීමට කටයුතු කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ආ) | කඩකාමරයක් ටෙන්ඩර් නොකර 2017 වර්ෂයේ සිට වාර්ෂික ගාස්තු සංශෝධනය කරමින් හා ගිවිසුම් අලුත්කරමින් එකම පුද්ගලයෙකු වෙත බදු දී තිබුණි. | එය සභා තීරණයකි. | කඩකාමර ටෙන්ඩර් මගින් ලබාදිය යුතු වේ. |
| (ඇ) | ගාස්තු අයකරන පිළිවෙල ගැසට් නිවේදන මගින් ප්‍රසිද්ධ කර තිබියදී, ඊට පටහැනිව, ඩිජිටල් දැන්වීම් පුවරුවක ගාස්තු තීරණය කිරීම නිසා 2021 ජූලි සිට වූ දෙවර්ෂයක් සඳහා රු.510,720ක ආදායමක් අහිමි වී තිබුණි. | සභාපතිවරයා විසින් වර්ග අඩියකට වාර්ෂික ගාස්තුව රු.200ක් ලෙස සලකා ගාස්තු අයකර ගැනීමට ලිඛිතව නියෝග කර ඇත. | සිදු වී ඇති අලාභය වගකිවයුතු අයගෙන් අයකළ යුතු වේ. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 පොදු උපයෝගීතා සේවා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 වර්ෂයේ කාර්යසාධන වාර්තාව අනුව මාර්ගවල වැසි ජල කාණු පද්ධතිය ඉදිකිරීමේ ප්‍රගතිය සියයට 20ක් හා පවතින කානුවල නඩත්තු කිරීමේ ප්‍රගතිය සියයට 54ක් වැනි අඩු මට්ටමක පැවතිණි. | රාජ්‍ය වියදම් සීමා කිරීම මීට හේතුව වී තිබුණි. | අත්‍යාවශ්‍ය පොදු පහසුකම් අඛණ්ඩව පවත්වාගෙන යා යුතු වේ. |

**3.2 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත වත්කම්**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වර්ෂ 2019-2020 කාලය තුළ මිල දී ගත් රු.231,175ක විදුලි උපාංග මේ දක්වාම අභාවිතව පැවතිණි. | ඉදිරියේදී භාවිතයට ගන්නා බව දන්වමි. | වත්කම් අභාවිතව නොතැබිය යුතු වේ. |

**3.3 වත්කම් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අලුත්වැඩියා කටයුතු සඳහා 2023 පෙබරවාරි මාසයේදී වසා දමා තිබුණු බලංගොඩ තානායමේ එම අලුත්වැඩියා කටයුතු 2023 ඔක්තෝබර් දක්වාම ආරම්භ කර නොතිබුණි. තානායම විවෘතව නොතැබීම නිසා මාසිකව රු.300,000ක පමණ ආදායමක් අහිමි වී තිබුණි. | එම අළුත්වැඩියාවට අනුමැතිය හා ඊට අවශ්‍යය ණය පහසුකම් ලබා ගැනීම සඳහා කටයුතු කරමින් පවතියි. | වත්කම් අභාවිතව නොතැබිය යුතු වේ. |